# A solution for SAITM

## *Better Standards for Medical Education*

The standards of medical education in Sri Lanka need to be raised to meet tomorrow's needs. This is an enormous task that the Government alone cannot do; private sector participation is essential.

Ensuring the quality and high standards of medical education is the responsibility of the Government and leaders of the medical profession. To accomplish this without burdening the taxpayers of this country who are already bearing heavy burdens, private-public partnerships are needed. Together, we will be able to create a modern health service with higher standards.

In this context, following measures will be taken as a law-abiding, inclusive and responsible Government on resolving the SAITM issue:

1. **Students of SAITM who have been successful in the final examination of the degree programme will be provided a clinical training at state hospitals either at Homagama or Avissawella.**

2. **It will be made compulsory for these students to face a test to be conducted under the supervision of the Sri Lanka Medical Council (SLMC) and the University Grants Commission (UGC).**

3. **The Government will introduce legislation to stipulate the minimum standards for admission to Medical Education.**

4. **The 'Dr Neville Fernando Hospital' is to be taken over by the Government and be utilised as a Teaching Hospital.**

The Government's policy position is that Private Sector must be encouraged to set up Institutions of Higher Education with high standards under state regulatory supervision.

This is the vision of the Government in creating a liberal environment for the higher education sector for the benefit of all citizens.

**Ministry of Higher Education & Highways**
**Ministry of Health, Nutrition & Indigenous Medicine**

Department of Government Information

*Knowledge & prosperity through freedom of education*

# සයිටම්

## සඳහා රජයෙන් විසඳුමක්

### *වෛද්‍ය අධ්‍යාපනයට තිරසර ප්‍රමිතියක්*

හෙට ලෝකයට ඔබින රටක් හදන්නට නම් අධ්‍යාපනයටත් පෞද්ගලික අංශයේ සහාය අත්‍යවශ්‍යයි. එහි ගුණාත්මකභාවය සහතික කිරීම රජයේ වගකීමයි. වඩාත් උසස් සෞඛ්‍ය සේවාවක් මෙරට තුළ තහවුරු කිරීම සඳහා වෛද්‍ය අධ්‍යාපනය තවදුරටත් පුළුල් කිරීම හා ගුණාත්මකව වර්ධනය කිරීම කළ යුතුයි.

'සයිටම්' පිළිබඳව මෑතදී නිර්මාණය වූ අර්බුදය නිරාකරණය කිරීම සඳහා නීතිගරුක හා වගකිව යුතු රජයක් ලෙස පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ ඒ නිසයි.

1. **වෛද්‍ය උපාධියට අදාළ අවසන් පරීක්ෂණය සමත් 'සයිටම්' සිසුන් හට හෝමාගම හෝ අවිස්සාවේල්ල රෝහල්වල සායනික පුහුණුව ලබාදීම.**
2. **ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අධීක්ෂණය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයකට මෙම සිසුන් පෙනී සිටීම අනිවාර්ය කිරීම.**
3. **වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ අවම ප්‍රමිතීන් නීතිගත කිරීම.**
4. **'වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහල' රජයට පවරා ගෙන ශික්ෂණ රෝහලක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම.**

**නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කිරීම රජයේ ප්‍රතිපත්තියයි.**
රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන අනාගතයට අවශ්‍ය පරිදි නවීකරණය කොට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව වැඩි කිරීම රජයේ පරමාර්ථයයි.
ඉහළ ප්‍රමිතියෙන් යුත් උසස් අධ්‍යාපන ආයතන රජයේ අධීක්ෂණය යටතේ පිහිටුවීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම එම කාර්ය පහසුකර ගැනීමට හේතු වෙයි.
**සැමට අධ්‍යාපනය ලද හැකි නිදහසක් මෙරට තුළ උදාකළ හැක්කේ එවිටයි.**

**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය**
**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

***අධ්‍යාපනයට නිදහසක් - උගත් පොහොසත් රටක්***